# මානව අයිතිවාසිකම් සහ දේශගුණික විපර්යාස පිලිබඳ ජාත්‍යන්තර අධිකරණයේ උපදේශන මතයක් ලබා ගැනීම උදෙසාය.

**ලොව විශාලතම ගැටලුව ලොව ඉහලම අධිකරණය වෙත ගෙන ඒම: දේශගුණික යුක්තිය උදෙසා අගනා තාරුණ්‍ය (WYCJ) මගින් ජාත්‍යන්තර අධිකරණයේ උපදේශනාත්මක මතයක් බලාපොරොත්තු වන්නේ, එමගින් මානව අයිතිවාසිකම් සහ දේශගුණික අර්බුද පිළිබඳ අන්තර්ජාතික නීතියේ ප්‍රගතිශීලි සංවර්ධනයට දායක විය හැකි බැවිනි. WYCJ මෙහිදී රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ සහය පතන්නේ දේශගුණික යුක්තිය සහ වර්තමාන හා අනාගත පරපුරයන්හි අයිතීන් සුරක්ෂණය උදෙසා වන අවහිර ඉවත් කිරීම පිණිසත් ය.**

## මානව අයිතිවාසිකම් සහ දේශගුණික අර්බුද

මානව අයිතිවාසිකම් සහ දේශගුණික අර්බුද අතර සම්බන්ධතාවය මේ වනවිට මනාව ස්ථාපනය වී ඇත. දේශගුණික බලපෑම් පෙර නොවූ විරූ ලෙස උග්‍ර වී ඇති අසමානතාවයන් සහ මානව අයිතීන් හා බැඳී අභියෝග වන දුගීභාවය, යහපැවැත්ම, ධනය බෙදීයාමේ අසමතුලිතතාවය, ස්ත්‍රී පුර්ෂ සම්බන්ධතා ආදීන්ට බලපාන බව පෙනී යන්නක් වන අතර,[1] ඉන් අවධානමට ලක් විය හැකි කණ්ඩායම් වෙත උග්‍ර බලපෑමක් ද ඇත.[2] බොහෝ මිනිසුන්ගේ ජීවිතය, ජලය, සනීපාරක්ෂාව, ආහාර, අධ්‍යාපනය සහ ස්වයං නිර්ණය ආදී වත්මන් සහ අනාගත මානව අයිතිවාසිකම් භුක්ති විඳීම කෙරෙහි මෙම දේශගුණික විපර්යාස අවම කිරිම් සහ එහි අනුවර්තන පියවරයන්හි බලපෑම ඇති මහත්ය. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ විධායක අධ්‍යක්ෂකවරයා වන Achim Steriner මහතාගේ අදහස අනුව, "දේශගුණික විපර්යාස සහ එයට දක්වන ප්‍රතිචාර මානව හිමිකම් කෙරෙහි බලපෑම් ඇති කළ හැකි බව එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාතික ආණ්ඩු පිළිගන්නා අතර,[3] මෙම ගැටළුව විසඳීම සඳහා ඊට

[1] OHCHR, Report of the Office of the United Nations High Commissioner for Human Rights on the Relationship Between Climate Change and Human Rights,U.N. Doc. A/HRC/ 10/61, January 15, 2009
[2] Inter-American Court of Human Rights, Advisory Opinion OC-23 /17, of November 15, 2017.
[3] For example in the Male Declaration (2007), Cancun Agreement (2010).

වඩාත් සුදුසු වන බැඳීම් සම්බන්ධයෙන් රජයන් සහ පෞද්ගලික ක්‍රියාකාරීන් අතර අඩු එකඟතාවයක් ඇත.”[4] මෙම එකඟතාවයන් අතර ගැඹුරේ ස්වභාවය පිළිබඳ බලධාරී පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ.

දේශගුණික යුක්තිය පිළිබඳ අධිකරණයෙන් බලධාරී මග පෙන්වීමක් සඳහා වූ මෙම ඉල්ලීම දේශගුණික ව්‍යසනය හේතුවෙන් බොහෝ දුරට බලපෑම් එල්ල වී ඇති කලාපයන්ගෙන් එකක් වන පැසිපික් දූපත් වල සිසුන් විසින් ආරම්භ කරන ලදී. සදාචාරාත්මක පසුබිමක් ඇති මෙම නායකත්වයට CSOs සහ පැසිපික් රාජ්‍යයන් 139 ක සහාය ලැබී තිබෙන අතරම, වර්තමාන සහ අනාගත පරම්පරාවන් සඳහා දේශගුණික යුක්තිය සෙවීම අරමුණු කොටගෙන ලොව පුරා සිටින යොවුන් ප්‍රජාව දායක කර ගැනීම සහ ගෝලීය සහයෝගීතාව සඳහා පෙළඹවීමක්ද මින් බලාපොරොත්තු වේ.

## උපදේශනාත්මක මතය

පැරිස් ගිවිසුමට යටතේ වඩාත් සාර්ථක ක්‍රියාමාර්ගක් හඳුන්වා දීමට අධිකරණයට උපදේශනාත්මක මතයක් ලබා දීම තුළින් හැකියාවක් ඇත. දේශගුණික විපර්යාස අවම කිරීම සහ ජාත්‍යන්තර සහයෝගීතාව හා බැඳියාව පිළිබඳ බලධාරී බවක් සහිත කරුණු රාජ්‍ය ක්‍රියාමාර්ග සඳහා සැපයීම, මානව අයිතිවාසිකම් සහ පාරිසරික නීතිය වැනි දැනට වෙන්ව ඇති ජාත්‍යන්තර නීති ක්ෂේත්‍ර ඒකාබද්ධ කිරීම, දේශගුණික විපර්යාස පිළිබඳ විද්‍යාත්මක සාක්ෂි ලබා ගැනීම සඳහා දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර විනිශ්චයන් මෙන්ම එකඟතාවයන් සඳහා පෙළඹවීම සහ මග පෙන්වීමක් සැපයීම මෙහිදී සිදුකළ හැකිය. මිට පෙර තරුණ ප්‍රජාව $CO_2$ (කාබන්ඩයොක්සයිඩ්) විමෝචනයට ලබා දී ඇති දායකත්වය අවම නමුත්, ඔවුන් දේශගුණික බලපෑම් වලට මුහුණ දීමේ ප්‍රවණතාවය ඉහල යාම නිසාවෙන්, වර්තමාන සහ අනාගත පරම්පරාවන් උදෙසා **ලොව පුරා තරුණ තරුණියන් දේශගුණික යුක්තිය අපේක්ෂා කිරීම** පුදුමයකට කරුණක් නොවේ.

[4] UNEP and Sabin Center for Climate Change Law (Colombia Law School), 'Climate Change And Human Rights' (United Nations Environment Programme2015) <https://web.law.columbia.edu/sites/default/files/microsites/climate-change/climate_change_and _human_rights.pdf> accessed 24 November 2020, 8.

## උපදේශනාත්මක මතයක් ඉල්ලා සිටීම

සාමාන්‍යය තත්වය තුළ අන්තර්ජාතික අධිකරණයන්හි තීන්දු තීරණ බලහත්කාරයෙන් බලාත්මක කිරීමේ හැකියාවක් නොපවතින නමුත්, මෙම ගෞරවනීය අධිකරණ මණ්ඩලය මෙම තීරණ සලකා බලනුයේ සදාචාරාත්මක හා නෛතික අධිකාරියක් තුළ වීම වැදගත්ය. ICJ යනු එක්සත් ජාතීන්ගේ ("UN") ප්‍රධාන අධිකරණ ආයතනයයි.[5] ICJ වෙතින් උපදේශන මතයක් ඉල්ලා සිටීමට එක්සත් ජාතීන්ගේ සහ එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන යටතේ පවතින අනු ආයතන වලට හැකියාවක් ඇත.[6] 'ඕනෑම නීතිමය ගැටලුවකට' අදාලව උපදේශනාත්මක මතයක් ලබා දෙන ලෙස එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ("UNGA") සහ ආරක්ෂක මණ්ඩලය විසින් ඉල්ලීම් කළ හැකිය. මෙහිදී අපගේ අරමුණ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ("UNGA") හරහා උපදේශනාත්මක මතයක් ඉල්ලා සිටීම යි. උපදේශනාත්මක මතය ඉල්ලා සිටීම කෙරෙහි ලොව පුරා සිටින තරුණ ප්‍රජාව සහ පුරවැසියන් උනන්දුවක් දක්වන බව අපි විශ්වාස කරමු. ICJAO මීට ආරම්භක සංවාදයක් වනු ඇතැයි අපි බලාපොරොත්තු වන අතරම, එය ජාත්‍යන්තර නීතියේ විවිධ ප්‍රභවයන් අතර මෙතෙක් ඇති වඩාත් අභිලාෂකාමී මෙන්ම මානව හිමිකම් කේන්ද්‍ර ගත වූ දේශගුණික ක්‍රියාමාර්ග සහ ජාත්‍යන්තර නීතිය යටතේ පවත්නා බැඳීම් පිළිබඳ බලධාරි විශ්ලේෂණයක් ඇති කරවන ගිනි පුපුරක් වනු ඇතැයි ද බලාපොරොත්තු වෙමු.

## Youth of the World වශයෙන් අප

ICJ උපදේශනාත්මක මතය සඳහා ගෝලීය රාජ්‍ය සහ රාජ්‍ය නොවන සහයෝගය ලබා ගැනීමට අපි කටයුතු කරමින් සිටිමු. එක්සත් ජාතීන්ගේ සංවිධානය හරහා අපට මානව හිමිකම් සහ පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු ඩේවිඩ් බොයිඩ්ගේ සහය ලැබී ඇත. ලොව පුරා තරුණ කණ්ඩායම් සහ පුද්ගලයින් උපදේශනාත්මක මතයක් ලබා ගැනීමේ ධනාත්මක බලපෑම වෙනුවෙන් එක්ව ඇත. ලෝකය පුරා මෙම කරුණ අප අපගේ සංවිධාන හරහා ව්‍යාප්ත කරමින් සිටින අතර, රජයන් සමග සිදු කරන සාකච්ඡා සහ තුලනාත්මක අධ්‍යාපන ක්‍රමවේදයන් හරහා ජාත්‍යන්තර නීතියේ කාර්යභාරය සහ දේශගුණික අර්බුදය හා මානව හිමිකම් අතර ආවේනික සම්බන්ධතාවය පිළිබඳ

[5] Article 93 para. 1 Charter of the United Nations.
[6] Article 96 Charter of the United Nations and article 65(1) of the Statute of the International Court of Justice.

දැනුවත් කිරීම් සිදු කරනු ලබයි. වැඩි විස්තර සඳහා කරුණාකර www.wy4cj.org වෙබ් අඩවියට පිවිසෙන්න.

**The World's Youth වන අප, වර්තමාන සහ අනාගත පරපුරේ මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ජාත්‍යන්තර අධිකරණය වෙත යන මෙම ගමන ගැන බලාපොරොත්තු සහගත වෙමු. ඔබ අප සමඟ සිටිනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.**